**නානාට්ටාන් ප්‍රාදේශීය සභාව**

**------------------------------**

**මන්නාරම් දිස්ත්‍රික්කය**

**---------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

----------------

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**-----------------------------------**

2018 වර්ෂයේ මූල්‍යප්‍රකාශන 2019 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර,එම මූල්‍යප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දිනද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ඔක්තෝබර් 31 දිනද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

--------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට නානාට්ටාන් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**--------------------------------------------**

**(අ) ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**------------------------**

| <u>**විගණන නිරීක්ෂණය**</u> | <u>**නිර්දේශය**</u> | <u>**ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම**</u> |
|---|---|---|
| සභාව විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන තුලින් හෙළිදරව් කර නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කළ යුතුය. | ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කරන බව දන්වා සිටිමි. |

**(ආ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

**----------------------------------------------------------**

.

| <u>**විගණන නිරීක්ෂණය**</u> | <u>**නිර්දේශය**</u> | <u>**ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම**</u> |
|---|---|---|
| 2018 වර්ෂය සඳහා සභාවේ ශේෂ පත්‍රයේ ඉඩම් හා ගොඩනැගිලි ලෙස පෙන්වා ඇති ඉඩම් 21 ක අයිතිය තහවුරු කිරීම සඳහා විගණනයට කිසිදු ලේඛනයක් ඉදිරිපත් කර නොමැත. | සභාවේ හිමිකාරිත්වය සනාථ කරන ඔප්පු සභාව විසින් ආරක්ෂා කළ යුතුය. | සභාවේ වත්කම් සඳහා අදාළ ලියකියවිලි ලබා ගැනීමට කටයුතු කරමින් සිටී |

**1.4 අනුකූල නොවීම්**

**1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරණ ජාතික විගණන පනත අංක 16 (2) උපවගන්තිය | සමාලෝචන වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කර නොමැත. | වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශය සමඟ ඉදිරිපත් කිරීමට පියවර ගත යුතුය. | වාර්ෂික කාර්යසාධන වාර්තාවක් සකස් කර ඇත. |
| **(ආ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | | | |
| | (i) මුදල් රෙගුලාසි 371 | රු. 1,959,876 ක් වටිනා අත්තිකාරම් මුදල අවුරුදු අටේ සිට දහහත දක්වා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | අත්තිකාරම් ඉක්මනින් නිරවුල් කිරීමට **පියවර** ගත යුතුය. | විමර්ශන කමිටුව ප්‍රාදේශීය කොමසාරිස් විසින් පත් කර ඇති අතර ඒ සඳහා කටයුතු කරනු ලැබේ. |
| | (ii) **මුදල් රෙගුලාසි 571** | **රු. 1,769,914 වටිනා කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් පියවර ගෙන නොතිබුණි.** | **කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් පියවර ගත යුතුය.** | **ප්‍රාදේශීය කොමසාරිස් විසින් විමර්ශන කමිටුව පත් කර ඇත.** |

**2. මූල්‍ය සමාලෝචනය** **--**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 15,797,329 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 2,939,055 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | 2017 | | |
|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | රැස්කළ ආදායම | 2018.12.31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | රැස්කළ ආදායම | 2017.12.31 දිනට මුළු හිඟය |
| | රු. | රු | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 352,000 | 599,480 | - | 411,000 | 472,910 | - |
| කුලී | 14,194,766 | 17,373,534 | 862,160 | 6,352,055 | 5,666,244 | 668,476 |
| බලපත්‍ර ගාස්තු | 585,000 | 554,457 | - | 670,000 | 575,769 | - |
| වෙනත් ආදායම් | 5,331,220 | 7,460,618 | 6,234,741 | 4,004,484 | 4,840,218 | 2,771,920 |
| එකතුව | **20,462,986** | **25,988,089** | **7,096,901** | **11,437,539** | **11,755,141** | **3,440,396** |

### 2.2.2 කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා වෙළෙඳපොළ සංකීර්ණය, තැපැල් ගොඩනැගිල්ල සහ කල්බදු හිමියන්ගෙන් අය කළ යුතු මුදල අය කර ගැනීමට ඵලදායීව කටයුතු කර නොතිබුණි. | හිඟ කුලී මුදල් අය කර ගැනීමට පියවර ගත යුතුය | පර්යේෂණ නිලධාරීන් විසින් නිරවුල් කිරීමේ පරීක්ෂණයක් පැවැත්වීමට පියවර ගනු ඇත. |

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

( අ ) උසාවි දඩ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගේ සහ අනෙකුත් නිලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 වන දිනට අයවිය යුතු උසාවි දඩ මුදල් ශේෂය රු.2,575,053 කි. | උසාවි දඩ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අයකිරීමට කටයුතු කරනු ලැබේ. |

**(ආ )** **මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ නිලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 වන දින රු. 3,332,553 ක මුද්දර ගාස්තු අයකළ යුතුව තිබුණි. | මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අයකිරීමට කටයුතු කරනු ලැබේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍යය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මං මාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ)** **ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2014 ජනවාරි 17 හා අංක පීසී/ආර්ඊසී/01/04/2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ ප්‍රකාරව සභාව විසින් ක්‍රියාත්මක කළ යුතු ක්‍රියාකාරකම් විස්සක් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම අදාළ කාල සීමාව තුළ සකස් කර අනුමත කළ යුතු වේ. | ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇත. |

**(ආ)** **තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 අප්‍රේල් 23 වන දිනැති අංක පොදු/2018/61 දරන විගණන ලේකම් කාර්යාලයේ චක්‍රලේඛය ප්‍රකාරව තිරසාර සංවර්ධනයට වෙරළාශ්‍රිත සම්පත් ආරක්ෂා කළ යුතු | චක්‍රලේඛයේ උපදෙස් පරිදි කටයුතු කල යුතුයි. | ඉදිරියේදී තිරසර සංවර්ධන සැලසුම් සකස් කර ක්‍රියාත්මක කරනු ලැබේ. |

අතර තිරසාර ලෙස දැනුවත් කිරීම් කටයුතු සහ සමුද්‍රීය සහ වෙරළාශ්‍රිත දූෂණය පාලනය කිරීමේ සැලසුම් කිසිවක් පිළියෙල කර නොතිබුණි.

**3.2 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 වන දිනට සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 65 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 61 ක් වී තිබුණු අතර සභාවේ පවතින පුරප්පාඩු 04 ක් පිරවීම සඳහා ඵලාදයී ලෙස කටයුතු කර නොතිබුණි. | පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කළ යුතුයි. | පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කරනු ලැබේ. |

**3.3 වත්කම් කළමනාකරණය**

**3.3.1 පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් භාවිතයට ගන්නා ලද වාහන 02 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කළ නොතිබුණි. | වාහනවල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. | අයිතිය පවරා ගැනීමට පියවර ගෙන තිබුණි. |

**4 ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ සභාවේ අයවැයගත වියදම් රු.42,449,037 ක් වී තිබූ නමුත් තථ්‍ය වියදම් රු.38,897,375 ක් වීම නිසා රු.3,551,662 ක වෙනසක් ඇති වී තිබීම අකාර්යක්ෂම අයවැය පිළියෙල කිරීමක් පෙන්නුම් කරයි. | අයවැය ලේඛනය සකස් කිරීමේදී විධිමත් මූල්‍ය පාලන ක්‍රම සලකා බලා සකස් කළ යුතුය. | අනාගතයේදී එවැනි වැරදි වළක්වා ගැනීම සඳහා වැඩි අවධානයක් කරනු ලැබේ. |